**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**කොළඹ**

<u>පුවත්පත් නිවේදනය</u>

**ඉන්දීය නිවාස ව්‍යාපෘතිය යටතේ ගාල්ල හෝමාදොල වතුයායේ නිවාස 50 ක් සඳහා මුල්ගල තැබීම**

2020 මාර්තු මස 2 වන දින ගාල්ල, උඩුගම, හෝමාදොල වතුයායේ පැවති විශේෂ උත්සවයකදී වැඩබලන ඉන්දීය මහ කොමසරිස් විනෝද් කේ. ජේකබ් මැතිතුමා, ප්‍රජා සවිබලගැන්වීම් සහ වතු යටිතල පහසුකම් අමාත්‍ය ගරු ආරුමුගම් තොණ්ඩමාන් මැතිතුමා සහ වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍ය රමේෂ් පතිරණ මැතිතුමා විසින් ඉන්දීය නිවාස ව්‍යාපෘතිය යටතේ එම වතුයායේ ඉදිකෙරෙන නිවාස 50 ක් සඳහා මුල්ගල තබන ලදී.

මෙම ව්‍යාපෘතිය වතුකර ප්‍රදේශයන්හි ජනතාව සඳහා නිවාස 14,000 ක් ඉදිකිරීමට ඉන්දියාව වූ පොරොන්දුවේ කොටසකි . නිවාස 60,000 ක් ඉදිකිරීමට අපේක්ෂා කරනු ලබන ඉන්දීය නිවාස ව්‍යාපෘතිය ඉන්දියානු ප්‍රදාන යටතේ ඉන්දීය රජය විසින් විදේශ රටක ක්‍රියාත්මක කරනු ලබන විශාලතම ව්‍යාපෘතිය වේ. මේ අතරින් උතුරු සහ නැගෙනහිර ප්‍රදේශයන්හි නිවාස 46,000 ක් දැනටමත් ඉදිකර ප්‍රතිලාභීන්ට භාර දී ඇත . වතුකර ප්‍රදේශවල ඉදිකිරීමට නියමිත නිවාස 14,000 න් නිවාස 2,500 ක් මේ වන විට ඉදිකර ඇත.

මෙයට අමතරව, ඉන්දීය රජය ගම්මාන සංවර්ධන වැඩසටහන යටතේ ශ්‍රී ලංකාව පුරා නිවාස 2,400 ක් ඉදිකිරීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හරහා නිවාස අමාත්‍යාංශය සමඟ එක්ව කටයුතු කරනු ලබයි.

මෙම ව්‍යාපෘතීන් ඉන්දීය රජය ශ්‍රී ලංකා රජය සමඟ ජනතා කේන්ද්‍රීය සංවර්ධන සහයෝගීතාවය ඉදිරියටත් පවත්වාගෙන යාම සඳහා දරන කැපවීමේ කොටසකි. ඉන්දියාව මේ වන විට ඇමරිකානු ඩොලර් බිලියන 3.5ක පමණ සංවර්ධන ආධාර ශ්‍රී ලංකාවට ලබා දී ඇති අතර ඉන් ඇමරිකානු ඩොලර් මිලියන 560ක්ම නැවත නොගෙවිය යුතු ප්‍රදාන වේ.

කොළඹ

2020 මාර්තු 2